(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 66.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 මැයි මස 04 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **විජේර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු  මොහොමඩ් නවවි මහතා

ගරු  ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  බුද්ධික පතිරණ මහතා

ගරු  (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු  කේ. කේ. පියදාස මහතා

ගරු  සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු  බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  තිලක් මාරපන මහතා

ගරු  (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු  එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු  සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු  බිමල් රත්නායක මහතා

ගරු  ප්‍රසන්න රණතුංග මහතා

ගරු  ප්‍රසන්න රණවීර මහතා

ගරු  රොෂාන් රණසිංහ මහතා

ගරු  කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  නාමල් රාජපක්ෂ මහතා

ගරු  අංගජන් රාමනාදන් මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු අලී සාහිර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්; සහ

(ii) 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්යසාධන වාර්තා

පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) ආපදා කළමනාකරණ අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013-2014 වර්ෂය සඳහා මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පෙත්සම් :**

(1) (i) උඩුමීය, පිදුරුවැල්ල, රත්මල් උයන යන ලිපිනයෙහි පදිංචි කේ. ඩේවිඩ් සිංඤෝ මහතාගෙන් ලැබුණු 2016.02.23 දිනැති පෙත්සම;

(ii) යාපනය, මනිපායි, සෙල්ලමුත්තු පාර යන ලිපිනයෙහි පදිංචි එල්. ඥානවේල් මහතාගෙන් ලැබුණු 2015.12.09 දිනැති පෙත්සම; සහ

(iii) යාපනය, කොයියාතොදම්, අළුත් පාර (පල්කුලම් පාර), අංක 9/6 දරන ස්ථානයෙහි පදිංචි එස්. එස්. තෙවාදසන් මහතාගෙන් ලැබුණු 2016.01.26 දිනැති පෙත්සම

ගරු බිමල් රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) වැලිගම, වල්ලිවල, ගොඩඉහළ, අංක 81/85 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එල්. එච්. සුනිල් සිල්වා මහතාගෙන් ලැබුණු 2016.03.17 දිනැති පෙත්සම;

(ii) දෙහිවල, අත්තිඩිය, කහවිට මාවත, අංක 7/2 1/1 දරන ස්ථානයෙහි පදිංචි එච්. කේ. මාලනී මහත්මියගෙන් ලැබුණු 2016.03.03 දිනැති පෙත්සම; සහ

(iii) පුහුල්වැල්ල, කිරින්ද, මස්ජිද් මාවත, අඹගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්. එස්. ෆාතිමා අරුෆා මෙනවියගෙන් ලැබුණු 2016.03.03 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු ආරුමුගම් සත්‍යමූර්ති මහතාගෙන් ලැබුණු 2015.12.04 දිනැති පෙත්සම ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ සාමාජිකයකු බවට පත්වීමට ශ්‍රී ලංකාවට අවකාශ සලසනු පිණිස එම බැංකුව ස්ථාපිත කරමින් එළැඹි ගිවිසුමේ අත්සන්කරුවකු වන ශ්‍රී ලංකාව විසින් එකී ගිවිසුම අපරානුමත කිරීම හෝ පිළිගැනීම සඳහා බලය පැවරීමට සහ, ඊට සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 මැයි මස 17 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**4. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු එඩ්වඩ් ගුණසේකර මහතා, ගරු ලකී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත බුද්ධශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ඉම්රාන් මහරූෆ් මහතා, ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අකුරණ බයිතුස් සකාත් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**8. ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

(අ. භා. 2.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.36 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.30 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 38 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

**උපලේඛනය**

"උපලේඛනය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත තුන්වැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**9. කල් තැබීම (ප්‍රබුද්ධ කලා පරපුරක් සඳහා වන වැඩපිළිවෙළක්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.10 ට, 2016 මාර්තු මස 08 වැනි දින සභා සම්මතිය අනුව 2016 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.